**බෙලිඅත්තප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම**
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013මාර්තු 22 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 5 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම**
------------------------------------------------------------------

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින්ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------
පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පතු 20 කට අදාල සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු. 882,765 ක් වුවද , ජර්නල් සටහන් අංක 10 න් එය රු. 837,667 ක් ලෙස ගැලපීම හේතුවෙන් පොළී ආදායම රු. 45,098 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම රු. 48,253 ක් වුවද , ලෙජරයේ එය රු. 9,698 ක් ලෙස දැක්වීම හේතුවෙන් ආදායම් ණයගැතියන් රු. 38,555 කින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) රු. 2,953,766 ක මුදලක් නව කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිරිපස හා පිටුපස කාර්යාලය ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණද ලේඛන අනුව රු. 2,679,567 ක මුදලක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව කාර්යාල ගොඩනැගිලි වටිනාකම රු. 274,199 කින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබූ එකතුව රු. 1,042,586 ක් වූ ස්ථාවර වත්කම් වල පිරිවැය අදාල වත්කම් ගිණුම් හරකර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම ගිණුම බැරකර නොතිබුණි.

**1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

**සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම් විෂයයන් 02 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන / උපයෝගී ලේඛන අතර රු. 8,408,349 ක පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය.**

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 7,947,550 ක් වූ ගනුදෙනු සම්බන්ධව ලේඛන, උපලේඛන, කාල විශ්ලේෂණ පිළිබඳ සාක්ෂි විගණනට ඉදිරිපත් නොකෙරුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,860,840 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,066,382 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| i. | වරිපනම් හා බදු | 2,838 | 2,786 | 860 |
| ii. | බදුකුලී | 9,618 | 7,923 | 1,291 |
| iii. | බලපත්‍ර ගාස්තු | 442 | 623 | - |
| iv. | වෙනත් ආදායම් | 55,240 | 31,269 | 90,402 |

**2.2.2 වරිපනම් හා බදු**

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ආදායම වූ රු. 851,782 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.3 බෙලිඅත්ත සාප්පු සංකීර්ණයේ කඩ බදු**

**----------------------------------------**

2007 මැයි 30 දිනැති රැස්වීමේ තීරණය අනුව වර්ග අඩි 11152 ක් වූ තෙවන මහල පුද්ගලික සමාගමකට බදු දීමට කටයුතු කර තිබුණි.

(i) ගිවිසුම් ප්‍රකාරව රුපියල් ලක්ෂ 30 ක එක්වන් මුදල වාරික 03 කින් වසරක් තුල (2008 ජුනි 08 දින වන විට) ගෙවිය යුතු බව ගිවිසුමේ දක්වා තිබුණි. නියමිත කාලය තුළ මුදල් ගෙවීමට බදුකරු කටයුතු කර නොතිබුණු අතර 2011 ජනවාරි 06 වන දින අවසන් වාරිකය ලෙස රුපියල් ලක්ෂ 05 ක් ගෙවා තිබුණි.

(ii) 2012 අගෝස්තු 07 දිනපැවතිමහාසභාරැස්වීම්වාර්තාවේතීරණඅංක 518 යටතේ සම්මත වී තිබුණු පරිදි එම මහලේ ව්‍යාපාර කටයුත්ත ආරම්භ කර නොමැති බව දක්වමින් මාස 05 ක බදුකුලිය 2012 ඔක්තෝබර් සිට ඉදිරි මාස 05 කට හිලව් කර 2013 මාර්තු සිට නැවත අයකිරීම් ආරම්භ කර තිබුණි. සභාවට අයත් දේපල බදුදීමේදී බදු ගිවිසුම් අත්සන් කළ දින සිට මාසික බදු කුලිය සභාවට අයකරගත යුතු වුවත් , ඊට පටහැනිව බදුකරුගෙන් කුලී අයකිරීම් කඩින්කඩ කර තිබුණි.

(iii) පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දින අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 04 ඡේදය අනුව එක්වන් මුදල් එකවර අයකරගත යුතු වුවද රු.15,000,790 ක එක්වන් මුදලක් කඩකාමර 48 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් හිඟව පැවතුණි.

(iv) උක්ත චක්‍රලේඛයේ 05 ඡේදය අනුව බදු ගිවිසුම වසර තුනකට වරක් යාවත්කාලීන කළයුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.

**2.2.4 හිඟ යන්ත්‍රෝපකරණ ආදායම්**

**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ අවසානයට බාහිර පාර්ශවයන්ගෙන් හා සභාවේ සේවයේ නියුතු අයගෙන් අයවිය යුතු රු. 1,209,189 ක් වූ හිඟ යන්ත්‍රෝපකරණ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම හිඟය තුල 2012 වර්ෂයට අදාල අයවිය යුතු යන්ත්‍රෝපකරණ ආදායම රු. 1,053,959 ක් විය. එය මුළු හිඟයෙන් සියයට 87 ක් විය.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 834,128 කඋසාවි දඩ හා රු. 14,399,604 ක මුද්දර ගාස්තු හිඟව පැවතුනි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

අංකRS – 1233 දරන බැකෝ යන්ත්‍රයට අයත් අඩි 01 ප්‍රමාණයේ කුල්ල 2013 පෙබරවාරි මාසයේ 14 දින හෝ ඊට ආසන්න දිනක අස්ථානගත වී තිබුණි. නැති වූ දේපලේ ආසන්නම අගය වූ රු. 104,227 ක් සමාන වාරික වලින් වගකිව යුතු අයගෙන් අයකර ගැනීම සුදුසු බව 2013 ජුනි 07 දිනැති පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ කර තිබූ අතර තවදුරටත් රු.34,742 ක් අයවීමට තිබුණි.

**4. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඇ) සේවක ණය පරිපාලනය